## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)

## පුරප්පාඩු

### තාක්ෂණ සහායක තනතුර

*(ස්ථිර පදනම)*

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) යනු ඉගෙනුම් සහ සංවර්ධනය, කළමනාකරණ උපදේශන සේවා හා පර්යේෂණ හරහා ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ ධාරිතාව ගොඩ නැංවීම සම්බන්ධයෙන් වගකිව යුතු ප්‍රමුඛතම රාජ්‍ය ආයතනයයි.

තාක්ෂණ සහායක තනතුරුවල පවතින පුරප්පාඩු ස්ථිර පදනම මත සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | අවශ්‍ය සුදුසුකම් හා දීමනා | තෝරාගැනීමේ ක්‍රමවේදය |
|---|---|---|
| තාක්ෂණ සහායක | **<u>පත්වීමේ ස්වභාවය</u>**<br>ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.<br>**<u>බාහිර අයදුම්කරුවන්</u>**<br><u>අධ්‍යාපන සුදුසුකම්</u><br>• අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයන් හයක් (06) සමත්ව තිබීම.<br><u>ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා</u><br>• (සිවිල් ඉංජිනේරු / ජලනල / විදුලි ) තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන් (NVQ) හි සිව්වැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>**<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**<br>තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ(05) ක පළපුරුද්ද | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මඟින් |

| | | |
|---|---|---|
| | සමඟ<br>කාර්මික විද්‍යාලයකින් / වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයකින් (Trade Test) සමත් වන ප්‍රවීණතා සහතිකයක් ලබා ඇති ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයේ සේවකයින්<br><br>**<u>වයස</u>**<br>අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.<br><br>**<u>වැටුප් පරිමාණය</u>**<br>PL 3 – 2025<br>43,280 – 10 × 490 – 10 × 540 – 10 ×590 – 12 × 630 – 67,040 | |

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**පොදු කරුණු :**

- නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය අදාළ සහතිකවල ඡායා පිටපත් සමඟ **"අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, 28/10, මලලසේකර මාවත, කොළඹ 07"** යන ලිපිනයට 2026.10.09 දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.
- ලියුම් කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුරු නාමය සඳහන් කළ යුතුය.
- අදාළ විස්තර සහ සහතිකවල ඡායා පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අයදුම් පත්‍රය SLIDA වෙබ් අඩවිය මගින් (www.slida.lk) හා රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය මඟින් (www.pubad.gov.lk) බාගත කර ගත හැකිය
- ඉහත සියලු බඳවා ගැනීම් සම්බන්ධ අවසාන තීරණය පාලක මණ්ඩලය සතු වේ.

---


**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය**
28/10, මළලසේකර මාවත
කොළඹ 07.
**දුරකථන:** 94 11 5980200 **ෆැක්ස් :** 94 11 2584406
**ඊමේල් :** mail@slida.**lk**